මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක :**LAE/2025/59**

**2025.04.20**

# පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025.05.06

2025.05.06 දින පැවැත්වෙන පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ දී එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන සඳහා කොට්ඨාස මට්ටමින් ඡන්ද විමසීම පවත්වා කොට්ඨාසය තුළ ම ඡන්ද ගණන් කොට ප්‍රතිඵල ප්‍රකාශයට පත් කෙරෙන බැවින් රාජ්‍ය සේවකයින් වැඩි සංඛ්‍යාවක් සහ රාජ්‍ය සම්පත් වැඩි ප්‍රමාණයක් ඡන්ද විමසීම් කටයුතු සඳහා යෙදවීමට සිදු වේ.

02. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ, 104 ඊ (1), (2) , 104( උ) සහ 104 ඌ ව්‍යවස්ථාවල දැක්වෙන පරිදි මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඡන්ද විමසීම් රාජකාරී සඳහා තම ආයතනවල සියලුම නිලධාරීන්ගේ නිලධාරී සංගණන දත්ත පත්‍රිකා හා වාහන පිළිබඳ තොරතුරු මැතිවරණ කොමිෂන් සභාව වෙත ලබාදෙන ලෙස සියලුම අමාත්‍යාංශ ලේකම්වරු, කොමිෂන් සභා ලේකම්වරු, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරු, ආණ්ඩුකාර ලේකම්වරු ඇතුළු පළාත් අමාත්‍යාංශ ලේකම්වරු, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරු සහ සියලුම රාජ්‍ය හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් වෙත චක්‍රලේඛයක් මඟින් දන්වා ඇත.

03. එසේ වුවද, සමහර ආයතන වෙතින් නිලධාරීන් හා වාහන පිළිබඳ විස්තර මේ දක්වා අදාළ තේරීම්භාර නිලධාරීන් වෙත ලැබී නොමැති බව වාර්තා වේ. එබැවින් ස්වකීය ආයතනයේ නිලධාරී දත්තපත්‍ර ලබා නොදුන් නිලධාරීන්ගේ විස්තර හා වාහන පිළිබඳ විස්තර අදාළ තේරීම්භාර නිලධාරීන් වෙත වහාම ලබා දෙන ලෙස ආයතන ප්‍රධානීන් වෙත මෙයින් දන්වා සිටිනු ලැබේ.

04. ඒ අනුව ස්වකීය ආයතනවල නිලධාරීන්, වාහන ඇතුළු රාජ්‍ය සම්පත් මැතිවරණ කොමිෂන් සභාවේ ඉල්ලීම පරිදි ඡන්ද විමසීමේ කටයුතු සඳහා ලබා දීම මෙන්ම ඒ වෙනුවෙන් සහාය දැක්වීම සියලුම රාජ්‍ය නිලධාරීන්ගේ වගකීමක් බවත්, ඒ සඳහා බැඳී සිටින බවත් එයට පටහැනිව ක්‍රියාකිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීමක් බවත් වැඩිදුරටත් දන්වා සිටිමි.

ආර්.එම්.ඒ.එල්. රත්නායක
සභාපති, මැතිවරණ කොමිෂන් සභාව
(මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි)